# ලූසී සහ කතන්දර පොත



ඔසඳි කරුණාරත්න

# ලූසී සහ
# කතන්දර පොත


## ඔසදි කරුණාරත්න

**කතෘ**


### කතෘ ගේ වෙනත් කෘති

ඕලු මුව පැටියාගේ උපාය
කොත්තු ළමයා
Ami the magic lilliputian
අනිල් ගේ උපන්දිනය


මහ/ මහාමායා බාලිකා විදුහල

7 ශ්‍රේණිය E


2026.05.10


ISBN: 978-624-211-422-4

# පිදුම

මාගේ පවුලේ සැම දෙනාටත්,

මගේ වැරදි අඩුපාඩු පෙන්වා දුන් සිංහල විෂය උගන්වන නිවර්තනා ගුරු මෑණියන්ටත්,

චිත්‍ර ඇඳීම සඳහා මා හට විශාල සහයෝගයක් දැක්වූ නෙතුප මල්ලිටත්,

තාක්ෂණය ඔස්සේ මෙම පොත සෑදීමට මා හට විශාල සහයෝගයක් දැක්වූ දිළිනි අක්කාටත්,

වචනෙකින් හෝ මා දිරිමත් කළ සියලු දෙනාටත්

මෙම පොත පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යවක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
2026.05.10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කල හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්තය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු  දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේ දී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැප වී සිටි. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධන වි අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ
ශ්‍රී දළදා මාළිගාව
2026.05.10

# ලූසී සහ කතන්දර පොත

ලූසී පුංචි ළමයෙක්. එයා පොත් කියවන්න ගොඩක් කැමතියි. එයා සතියකට සැරයක් මහජන පුස්තකාලයට යනවා. දවසක් එයා ලොකු කතන්දර පොතක් ගෙනාවා. ගොඩක් පරණයි ඒ පොත. එකේ ගොඩක් කතාන්දර තිබ්බා. ඉතිං ලූසී එයාගේ පුංචි කාමරේට ගිහින් පොත කියවන්න හදනකොටම මායාවක් වගේ බලයක් ඇවිත් එයාව පොත ඇතුළට අරන් ගියා.



එයා ඇදිලා ඇදිලා  පුංචි ගැමි ගෙදරක් ළඟ නතර වුණා. ඒකේ හිටිය පුංචි ළමයෙක් කෑම කූඩෙකුත් අරගෙන එළියට ආවා. ඒ තමයි ලූසී කලින් කියවලා තියෙන පොත් වල ඉන්න රතු හැට්ටකාරී. ඉතින් ලූසී සහ රතු හැට්ටකාරී ටික වෙලාවක් කතා කළා. මේ රතු හැට්ටකාරිගේ නම ලිලී.



ඉතින් ලූසීනුයි ලිලීනුයි ලිලීගේ සීයා බලන්න ගියා. ඔය අතරේ එතන හිටියා හරි මෝඩ වගේම මිටි වෘකයෙක්. කෑම වල සුවඳ දැනිලා මේ වෘකයා කෑම ටික ඩැහැගන්න හිතලා ලිලීගේ පස්සෙන් යන්න ගියා.



ඔය අතරේ ලිලී සහ ලූසී, හැන්සල්, ග්‍රේටල් සහ මායාකාරී එක්ක කතා කර කර ඉඳලා ගියා විතරයි, වෘකයත් ආවා. මායාකාරීගේ රස කැවිලි නිවාසය දැකලා වෘකයටත් රස කැවිලි නිවාසයෙන් රස කැවිල්ලක් කන්න ආස හිතුණා. වෘකයා එතන තිබ්බ චොකලට් කෑල්ලක් අරගෙන කෑවා.



මේක දැකපු මායාකාරී ඉඟුරු පාන් මල්ලියෙක්ව හැදුවා. එයා හරිම විශාල ඉඟුරු පාන් මල්ලියෙක්. මායාකාරී ඉඟුරු පාන් මල්ලිට අණ කරා වෘකයාව එලවන්න කියලා. ඒත් මේ ඉඟුරු පාන් මල්ලි කළේ වෘකයාව රෝල් කරලා පාපන්දුවකට ගහනවා වගේ හයියෙන් පයින් පාරක් ගහන එක.




වෘකයා උඩ විසිවෙලා සුප් හැලියකට වැටුණා. ජැක් සහ යෝධයා සුප් බොන ගමන් තමයි ඉඳලා තියෙන්නේ. තරහා ගිය යෝධයා වෘකයාට විශාල පයින් පහරක් ගැහුවා. වෘකයා නැවතත් හිටපු ස්ථානයටම වැටුණා.



එයා ආයෙත් ලිලීගේ පස්සෙන් යන්න පිටත් වුණා. ලිලී සහ ලූසී යන ගමන් දැක්කා ලස්සන කුමාරිකාවක්. එයා තමයි සින්ඩරෙල්ලා. සින්ඩරෙල්ලා සමඟ ලිලී සහ ලූසී රජ මාළිගාවට ගියා රස ආහාර වේලක් ලබා ගත්තා. ලූසී සින්ඩරෙල්ලාගෙන් ඇහුවා එයා ආයෙත් ගෙදර යන්නේ කොහොමද කියලා. සින්ඩරෙල්ලා කීවේ කිසිම කතාවක් මඟ නොහැර යන ලෙසටයි.



යාළුවෝ දෙන්නා නැවතත් පිටත් වුණා. එයාලා ගෝල්ඩිලොක්ස් සහ වලස් පැටියා සෙල්ලම් කරනවා දැක්කා. ලුසීටත්, ලිලීටත් ආරාධනා කළා සෙල්ලම් කරන්න. ඒත් සීයා බලන්නට ගෙදර යාමට ඇති නිසා ගෝල්ඩිලොක්ස්ටයි, වලස් පැටියාටයි සමු දීලා යන්න පිටත්වුණා. මේ අතරේ වෘකයාට පාර වැරදිලා එයා වෙන ගම්මානෙකට ගිහින්. වෘකයාට කෑ ගහන සද්දයක් ඇහුණා. වෘකයාට පෙනුනේ ඇත්තටම භයානක දර්ශනයක්. ඒ සුප් ගඟක් තමා දෙසට ගලාගෙන එන ආකාරයක්.



ඒ ගලාගෙන එන්නේ මැජික් සුප් හැළිය බව තේරුම් ගන්නකොට වෘකයා ඒ ගඟට යටවෙලා ඉවරයි. ඔය අතරේ ලුසී සහ ලිලීත් ඒ ගම්මානේ ළඟට එනකොට මහා සුප් ගොඩක්. ඇත්තටම සුප් හැළියක් ඒ දෙන්න ළඟට ගලාගෙන ආවා. ඒ දෙන්නා දිව්වා ඒත් ඒ දෙන්නා සුප් ගංඟාවට අහුවුණා. හදිසියෙන්ම පුංචි ගැහැණු ලමයෙක් එතනට ඇවිත් "නවතින්න" කියලා කිව්වා. එතකොට ඒ සුප් ගලායාම නැවතුණා. ලිලී සහ ලුසී එතනින් නැගිටලා ගියා.




එයාලගේ ඇඟ පත සෝදගන්න තැනක් හොය හොයා යනකොට එයාලට හම්බවුණේ බූට් පූසාව. බූට් පූසා තමන්ගේ හාම් පුතාගේ මාළිඟාව ළඟ තිබුණු ජලාශයක් පෙන්නලා සෝදගන්න කිව්වා. ලීලී හා ලුසී ඇඟ පත සෝදගෙන යන්න යන විට බූට් පූසා දිවා ආහාරයට ආරාධනා කළා. ආහාරයට සම්බන්ධ වෙලා නැවතත් පිටත් වුණා.



අර ගම්මානය දැන් සුප් වලින් පිරිලා. හැමෝම ඒකට උපදෙසක් හොයමින් ඉන්නකොට එතනට ආවා විශාල ඉඟුරු පාන් මල්ලී. එයා එක හුස්මට විශාල හැන්දකින් ඒ සුප් බිව්වා. ඉඟුරු පාන් මල්ලී දැක්කා සුප් යට හිරවෙලා ඉන්න වෘකයාව. එයා ආයෙත් වෘකයාට පයින් පාරක් ගැහුවා. වෘකයා විසිවෙලා ගිහින් වැටුණේ ලිලීගේ සීයලාගේ ගෙදරට. ලිලීගේ අත්තම්මයි, සීයයි, ලිලීයි සහ ලූසීයි මේ වෘකයාට තේ බොන්න ආරාධනා කළා.



දැන් ලුසී යන්න ඕනී. එයා තව විශාල දොරක් ළඟට ගිහින් මේ කතන්දර ලෝකේ හැමෝටම සමු දීලා දොරෙන් එළියට ගියා. විශාල ආලෝකයක් එක්ක ලුසී ආයෙත් එයාගේ පුංචි කාමරේට ආවා. ඉක්මනට එයා කුස්සියට ගියේ අම්මා බයවෙලා ඇති කියලා. එයා යනකොට දැක්කේ එයාගේ අම්මා එයාට කුකීස් එක්ක කිරි ලෑස්ති කරලා තියෙනවා. කුකීස් එක්ක කිරි බොන ගමන් එයා අම්මාට ඔක්කොම විස්තරේ කිව්වා.



නිමි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවරිධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම් (ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN -978-624-211-422-4**